# නිමා නොවන ගෝලීය ආහාර අර්බුදය හමුවේ දේශීය ආහාර සුරක්ෂිතභාවය පිළිබඳ විමසුමක්

'ආහාර අර්බුදයෙන් ස්ථාවරත්වයට' යන්න ඔක්තෝබර් 16 දිනට යෙදී තිබූ ලෝක ආහාර දිනයේ මෙවර තේමාව යි. 2008 වසරේ මුල් භාගයේ ලොව පුරා පැවති ආහාර අර්බුදයෙ හි අමිහිරි මතකයන් වියැකී යාමටත් පෙර 2010 වසරේ අවසානයේ සිට ලෝක ආහාර මිල ගණන් නැවතත් ඉහළ මට්ටමකට ළගාවීම සිදුවිය. දශක ගණනාවක් තිස්සේ ස්ථාවරව පැවති ආහාර මිල ගණන් පසුගිය වසර කිහිපයක සිට දැඩි ලෙස උච්චාවචනය (Price volatility) වීමේ තත්ත්වයට පත්ව තිබේ. මෙවර ලෝක ආහාර දිනයේ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ පණිවිඩයෙ හි සඳහන් වූ වැදගත්ම කරුණක් වූයේ 'ලෝකයේ සියළුම දෙනාට ලබාදීමට තරම් ආහාර නිෂ්පාදනය වුව ද, ලොව පුරා වර්තමානයේ දී බිලියනයකට ආසන්න සංඛ්‍යාවක් කුසගින්නේ පසුවෙති' යන්නයි. එමෙන් ම, ලෝක ආහාර දිනයේ දී ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රකාශයට අනුව, ජගත් සාගින්න හා සම්බන්ධ ගැටළු වෙත බරපතල ලෙස අවධානය යොමු කිරීමට නම්, ආහාර මිල උච්චාවචනයට සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීම කෙරෙහි වැඩි ප්‍රයත්නයක් දැරිය යුතු වේ. විශේෂයෙන්, තම ආදායමෙන් වැඩිම කොටසක් ආහාර මිල දී ගැනීම සඳහා වැය කරන ජනතාවට ඔවුනගේ පවුල් වලට ප්‍රමාණවත් හා පෝෂදායී ආහාර වෙළෙඳපොළෙන් ගෙන ඒමට ඇති හැකියාව සුරක්ෂිත කළ යුතු ය. සැපයුම ඉල්ලුමට සරිලන ලෙස තබා ගැනීමට වෙර දරන ලෝක ආහාර වෙළෙඳපොළ පීඩනයට හසුව තිබෙන අතර වර්තමානය වන විට ආහාර තොග (Food stock files) ඓතිහාසික වශයෙන් ඉතාම අවම මට්ටමකට පැමිණ හෝ එයට ආසන්න වෙමින් පවතී. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් වරයාගේ ප්‍රකාශයට අනුව, 2007-2008 ආහාර මිල උද්ධමනයේ දී දශලක්ෂ 80 කට වැඩි ජනතාව සාගින්නට පත් කෙරුන අතර මෑතක දී සිදු වූ ආහාර මිල ඉහළයෑම නිසා තවත් දශ ලක්ෂ 70 ක් අන්ත දුගී තත්ත්වයට පත් විය. එමෙන් ම දරිද්‍රතාවය, ආහාර අනාරක්ෂිතභාවය හා දුෂ්කරභාවය අතර ඇති සමබන්ධතාවය බිඳිය යුතු බව මෙහි දී, තවදුරටත් අවධාරණය වූ කරුණක් විය. මෙම තොරතුරුවලට අනුව ගෝලීය ආහාර සුරක්ෂිතභාවය (Global Food Security) අවිනිශ්චිත මට්ටමක පවතින අතර එය සියළුදෙනා විසින් ප්‍රමුඛතම අවධානය යොමු කළ යුතු කාරණය බව පැහැදිළි ය.

2007-2008 වසර වල ඇති වූ ලෝක ආහාර අර්බුදයට බලපාන ලද ප්‍රධාන කරුණු
**(Root Causes of World Food Crisis in 2007-2008)**

- ගෝලීය කාළගුණික විපර්යාසය- (Global Climate Change)
- ජෛව ඉන්ධන නිෂ්පාදන වියදම ඉහළයාම (Increase of Bio-Food Production)
- ආසියාව ඔස්සේ වර්ධනය වූ ඉහළ ඉල්ලුම (Increased Demand Across Asia)
- පෙට්‍රෝලියම් ඉන්ධන මිල ඉහළයාම (Impact of Oil Price Increase)
- බොහොමයක් රටවල ආහාර සංචිත පහළයාම (Decline World food Stock Files)
- ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළ අස්ථාවරත්වය (Instability of International Financial Market)
- ජනගහන වර්ධන වේගය Population Growth)

2007-2008 වසරවල ඇති වූ ආහාර මිල උද්ධමනයේ දී, ලොව පුරා දශ ලක්ෂ 80කට වැඩි ජනතාව සාගින්නට පත් කෙරිණි. 2010 වසරේ අග භාගයේ සිට නැවතත් ඉහළ යන ආහාර මිල

ගණන් හේතුවෙන් මේ වනවිට දශ ලක්ෂ 70ක් පමණ අන්ත දුගී තත්ත්වයට පත් වී ඇත. 2008 වසරේ ඇති වූ ආහාර අර්බුදයේ අමිහිරි අත්දැකීම් ඇතැම් රටවලට බෙහෙවින් කටුක විය. දකුණු අප්‍රිකානු රටවල් මෙයට බරපතල ලෙස මුහුණ දුන් රටවල් වන අතර ඇතැම් දකුණු ආසියාවේ රටවල ද ඇති වූ තත්ත්වය සතුටුදායක විය. මෙම ඔක්තෝබර් මාසයේදී ලෝක ජනගහනය බිලියන 7ක් වෙතැයි අපේක්ෂා කෙරේ. වාර්ෂිකව අළුතින් එකතුවන මිලියන 80ක් පෝෂණය කිරීමට ආහාර නිෂ්පාදනය වැඩි විය යුතු ය.

වර්තමාන තත්ත්වය අනුව, ලොව පුරා බිලියනයකට ආසන්න සංඛ්‍යාවක් දිනපතා කුසගින්නේ නින්දට යන අතර තවත් බිලියනයකට ආසන්න ප්‍රමාණයක් ආහාර අධි පෝෂණය හේතුවෙන් ස්ථූලභාවයට පත් වී රෝගාතුර වෙයි. ලෝක සෞඛ්‍ය සංවිධානයේ (WHO) තොරතුරුවලට අනුව ශරීර බර නියමිත ප්‍රමාණයට වඩා වැඩි බිලියනයක ප්‍රමාණයෙන් මිලියන 300ක් පමණ ස්ථූලතා තත්ත්වයේ පසු වේ. මෙම තත්ත්වයට (Obesity) පත් වූ විට දියවැඩියාව, අධිරුධිර පීඩනය හා හෘදයාබාධ තත්ත්වයන්ට පහසුවෙන් ගොදුරු වන බව අනාවරණය වී තිබේ. එමෙන් ම, වසර 2030 වන විට මෙම ස්ථූලභාවයේ රෝගී තත්ත්වය ලොව පුරා බෙහෙවින් බරපතල තත්ත්වයන්ට පත්වනු ඇතැයි අපේක්ෂිත (Global Epidemic) ය.

ශරීර බර දර්ශකය (Body Mass Index) 25 ඉක්ම වූ විට අධි බර තත්ත්වයක් ලෙස ද, (Over weight) එම අගය 30 ඉක්ම වූ විට ස්ථූලතා තත්ත්වය (Obesity) ලෙස ද හැඳින් වේ. ලොව පුරා ග්‍රාමීය අංශවල කාන්තාවන්ගෙන් 20%ක් පමණ අඩු බර තත්ත්වයෙන් (Under weight) සිටින අතර නාගරික ප්‍රදේශ වල කාන්තාවන්ගෙන් 15%ක් පමණ අධි බර (Over weight) තත්ත්වයේ පසුවෙති. නාගරික ප්‍රදේශවල මෙම අගය සීඝ්‍ර ලෙස වැඩි වෙමින් පවතී.

ශරීර බර දර්ශකය (BMI) අනුව, ශ්‍රී ලංකාවේ තත්ත්වය යහපත් නොවේ. මෙරට ජනගහනයෙන් 31%ක් පමණ මෙම අගය 25 ඉක්මවා ඇති අතර 22.6%ක් පමණ අගය 18.5 ට අඩු, එනම්, අඩු බර මට්ටමක පවතී. එනම් අධි බර හා අඩු බර තත්ත්වයෙන් පසුවන ප්‍රමාණය මුළු ජනගහනයෙන් අඩකට ආසන්න බව ය.

ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය (IFPRI) මගින් ප්‍රකාශයට පත් කරනු ලබන ගෝලීය සාගිනි දර්ශකය (Global Hunger Index) මගින් ලොව පුරා රටවල පවතින කුසගින්න පිළිබඳ තත්ත්වය අනාවරණය කරයි.

වගු අංක 1

**දකුණු ආසියානු රටවල් කිහිපයක ගෝලීය සාගිනි දර්ශක අගයන්**

| රට | 1999 | 1996 | 2001 | 2011 |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 20.2 | 17.8 | 14.9 | 14.0 |
| ඉන්දියාව | 30.4 | 22.9 | 24.1 | 23.7 |
| පාකිස්ථානය | 25.7 | 22.0 | 21.9 | 20.7 |
| බංගලාදේශය | 38.1 | 36.3 | 27.6 | 24.5 |
| නේපාලය | 27.1 | 24.6 | 23.0 | 19.9 |

*මූලාශ්‍රය : ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය*

වගු අංක 2

**දර්ශක අගය පරාසය අනුව අගයන් වන කාණ්ඩයන්**

| දර්ශක අගය | අයත් වන කාණ්ඩය පරාසය |
|---|---|
| 30 ට වැඩි | අතිශය අවදානම් (Xtreamly Elarnity) |
| 20-29.9 | අවදානම් (Alarting) |
| 10-19.9 | දැඩි අවදානම් (Serious) |
| 5-9.9 | මධ්‍යස්ථ (Moderate) |
| 4.9 ට අඩු | අඩුයි (Low) |

*මූලාශ්‍රය : ජාත්‍යන්තර ආහාර ප්‍රතිපත්ති පර්යේෂණ ආයතනය*

සෑම තත්පර 3.6කට ම කුසගින්න නිසා එක් පුද්ගලයෙකු ලොව මිය යන අතර මෙයින් 75%ක් ම ළමයින් වීම සුවිශේෂී කරුණකි. මේ වන විට, අප්‍රිකාවේ ඇතැම් ප්‍රදේශවල වසර 60කට පසු ඇති වූ දරුණුතම නියගයකින් දශ ලක්ෂ 13 ට වැඩි ජනතාවක් පීඩා විඳී. දකුණු සෝමාලියාවේ විශාල ප්‍රදේශයක් නියගයට ගොදුරුව ඇත. සහශ්‍රක සංවර්ධන ඉලක්ක ජය ගැනීමට නම් (Millenium Development) දුප්පත් මෙන් ම පොහොසත් රටවල් ද එක්සත්ව ක්‍රියා කිරීම අවශ්‍ය ය. වර්තමාන ආහාර මිල ගණන් අස්ථාවරත්වයට හේතු වූ ප්‍රධාන කරුණු අතර ගෝලීය කාලගුණික විපර්යාසය හේතුවෙන් නිෂ්පාදනය පහළයාම, කෘෂිකර්මාන්තයේ පර්යේෂණ හා සංවර්ධනය සඳහා දීර්ඝ කාලයක් තිස්සේ පැවති අඩු ආයෝජනය, ආදායම් ඉහළයාමත්

සමග ලොව පුරා පරිභෝජන රටාවන් ඉහළ යාම වැනි දේ දැක්විය හැකි ය. උදාහරණ ලෙස චීනයේ 1980 වසරේ දී එක පුද්ගල මස් පරිභෝජනය කිලෝග්‍රෑම් 20ක් වූ අතර එය 2007 වන විට කිලෝග්‍රෑම් 50ක් දක්වා ඉහළ ගොස් තිබේ. එමෙන් ම, මැතකාලීන ව ආහාර ද්‍රව්‍ය සඳහා ඉදිරි වෙළෙඳපොළ (Furure Markets) තුළට විශාල අරමුදල් සහිත ආයෝජකයින් පිවිසීම ද හේතු වූ තවත් කරුණකි. එමෙන් ම, වර්තමානයේ ජෛව ඉන්ධන සඳහා බෝග වගා කරනු ලබන බිම් ප්‍රමාණය ලොව පුරා වගා කළ හැකි බිම් ප්‍රමාණයෙන් 1-2% ක් අතර පවතී. මෙය සීඝ්‍රව වර්ධනය වන අතර වසර 2007-2017 අතර ලෝක එතනෝල් (Ethanol) නිෂ්පාදනය ලීටර් බිලියන 125 දක්වා දෙගුණ වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම සියළු කරුණු කාරණා හමුවේ ගෝලීය ආහාර මිල ගණන් ඉදිරියේ දී බොහෝවිට ඉහළ මට්ටමින්, අධික උච්චාවචනයන් (High Price Volatility) ගෙන් යුක්තව පවතිනු ඇත.

මේ අනුව, ආහාර සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීම සඳහා දේශීය වශයෙන් අවධානය යොමු කළයුතු අංශ ගණනාවකි.

## ශක්තීන් (Strengths)

අතීතයේ දී, පෙරදිග ධාන්‍යාගාරය ලෙස විරුදාවලිය ලැබුවේ දේශීය ස්වයංපෝෂිත ආර්ථිකයේ සවිමත් බව නිසා ය. ශ්‍රී ලංකාවේ සමාජීය-ආර්ථික හා සංස්කෘතික පදනම හා කෘෂිකර්මාන්තය අතර පවතින සහ සම්බන්ධතාවය සනාථ කිරීමට ඉතිහාසයෙන් ලබා ගතහැකි උදාහරණ අපමණ ය. ජෛව විවිධත්වයෙන් (Bio Divercity) පොහොසත් රටවල් අතුරින් ශ්‍රී ලංකාව ලොව ප්‍රධාන තැනක් ගනු ලබයි. මෙරට පවතින මල් පිපෙන ශාක විශේෂ 350කට අධික ප්‍රමාණයෙන් විශේෂ 850ක් ම ශ්‍රී ලංකාවට ආවේණික (Endemic) වූ ඒවා වේ.

ජල සම්පත සුරැකීමේ තාක්ෂණය මෙරට මුතුන් මිත්තන්ගෙන් ලැබුණු දායාදයක් වන අතර තිරසාර වාරි කර්මාන්තයක ප්‍රෞඪ ඉතිහාසයක් ශ්‍රී ලංකාව සතු ය. ලොව වෙනත් රටවල නොමැති පරිසර පද්ධති (Eco system) බොහොමයකි. එමෙන් ම, ලොව සාරවත් ම පසක් වන රතුවන් දුඹුරු පාංශු (Reddish Brown soil) ශ්‍රී ලංකාවේ වියළි කලාපය පුරා පැතිර පවතී. යල මහ කන්න අනුව ලැබෙන මෝසම් වැසි රටාවන් තවමත් මෙරටට ආශිර්වාදයකි. ආසියාවේ රටවල් අතුරින් ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය (Literacy rate) බෙහෙවින් ඉහළ මට්ටමක පවතී.

## දුර්වලතා (Weaknesses)

මෙරට ප්‍රධාන ආහාරය වන සහලින් ස්වයංපෝෂිත වුව ද, බොහොමයක් අතිරේක ආහාර බෝග වර්ග, පළතුරු, සත්ත්ව නිෂ්පාදන තවමත් සැලකිය යුතු ප්‍රමාණයක් ආනයනය කරයි. ඒ සඳහා වැය වන විනිමය ප්‍රමාණය විශාල ය. ශ්‍රී ලාංකිකයන්ගේ ආහාර පරිභෝජන රටාවන් ක්‍රමයෙන් අසතුටුදායක මට්ටමට පත්වෙමින් තිබේ. ඒක පුද්ගල ධාන්‍ය, පළතුරු, එළවළු, සත්ත්ව නිෂ්පාදන පරිභෝජනයන් ඉතාමත් පහළ මට්ටම්වල පවතී. එමෙන් ම පරිභෝජන රටාවන් හි ව්‍යාකූල බවක් පවතී. උදාහරණ ලෙස ග්‍රාමීය ප්‍රදේශවල පෝෂ්‍යදායී රනිල බෝගයක් වන මුංඇට, කව්පි, පරිභෝජනය බෙහෙවින් පහළ මට්ටමක තිබේ. ක්ෂණික ආහාර වර්ග සෑම අංශයකම ප්‍රචලිත වෙමින් තිබේ. පෝෂණීය අගයන්ගෙන් පොහොසත් ආහාර නාගරික දරුවන්ගේ පරිභෝජනයෙන් ඉවත් වෙමින් පවතී. මෙම තත්ත්වයන් තුළ මන්දපෝෂණයෙන් පෙළෙන ප්‍රමාණය තවමත් ඉහළ අගයක් ගනියි. අඩුබර සහ අධික බර තත්ත්වයේ පවතින ප්‍රතිශතය රට තුළ සැළකිය යුතු මට්ටමක පවතී. අත්‍යවශ්‍ය ආහාර බෝග ද්‍රව්‍යයන් වන අර්තාපල්, රතුළූණු, ලොකුළූණු, මුංඇට, කුරක්කන් දේශීය අවශ්‍යතාවයෙන් සැළකිය යුතු කොටසක් තවමත් ආනයනය කෙරේ. දේශීය ව නිපදවිය හැකි මිදි, දොඩම් සහ දෙළුම් වැනි පළතුරු වර්ග වල නිෂ්පාදනය නැංවීම අත්‍යවශ්‍ය කරුණකි. මේ සියළු කරුණු සඳහා මෙම ක්ෂේත්‍රය තුළ පර්යේෂණ අවස්ථා ඉහළ නැංවිය යුතු ය. එමෙන් ම, ඒ තුළින් ලැබෙන නව දැනුම ගොවීන් වෙත ලබාදීමේ ව්‍යාප්ති සේවය මෙ රට තුළ කාර්යක්ෂම කිරීම අනිවාර්ය කරුණකි.

## අවස්ථාවන් (Opportunities)

දේශීය කර්මාන්තයට බෙහෙවින් හිතකර රාජ්‍ය ප්‍රතිපත්තියක් මෙරට සතු ය. ශ්‍රී ලංකාව වී නිෂ්පාදනය අතින් ආසියාවේ රටවල් තුළ සතුටුදායක ප්‍රගතියක් පෙන්නුම් කරයි. වසර 2000 දී, මුළු වී නිෂ්පාදනය ටොන් මිලියන 2.8ක් වූ අතර එය 2010 වන විට, ටොන් මිලියන 4.3 දක්වා 50% කින් සුවිශේෂී වර්ධනයක් ලබා තිබේ. 2008 වසරේ ලෝක ආහාර අර්බුදයත් සමග ජාත්‍යන්තර

වෙළෙඳපොළෙහි පොහොර මිල ගණන් දෙ ගුණ වූ විට ද, මෙ රට තුළ පොහොර සහනාධාරය දිගින් දිගටම ක්‍රියාත්මක කරන ලදී. එය සුවිශේෂී ආයෝජනයක් වූ අතර වර්තමානයේ පොහොර සහනාධාර සඳහා වැය කරන මුදල මෙන් හතර ගුණයක් වටිනාකමකින් යුක්ත වී නිෂ්පාදනයකට උරුමකම් කීමකි. පසුගිය අගෝස්තු, සැප්තැම්බර මාසවල ශ්‍රී ලංකාවේ පැවති සහල් මිල ගණන් ලොව බොහොමයක් රටවල සහල් මිල ගණන්වලට සාපේක්ෂව අඩු මට්ටමක පැවතුනි. ශ්‍රී ලංකාව දැන් සහල් අපනයන වෙළෙඳපොළට අවතීර්ණ වීමේ අවස්ථාවට පත්ව සිටී. අනෙකුත් බෝග සලකා බැලීමේ දී ශ්‍රී ලංකාව ලෝකයේ ප්‍රධාන කුරුඳු නිෂ්පාදකයා වන අතර ශ්‍රී ලංකාවේ තේ ලෝකයේ අංක එකේ තේ බවට පත් ව තිබේ. ගෝලීය ආහාර අර්බුදය දේශීය නිෂ්පාදකයින්ට මහගු අවස්ථාවන් සලසා ඇත. දේශීය වශයෙන් නිපදවන කාබනික එළවළු, පළතුරු (Organic products), කැපුම් මල් කර්මාන්තය වැනි ක්ෂේත්‍රවල විශාල විභවයක් පවතී. එමෙන් ම, කෘෂිකර්ම ක්ෂේත්‍ර, බුද්ධිමය සම්පත සියල්ලන්ටම මහගු දායාදයකි. කෘෂිකර්ම පීඨ හතක්, කෘෂිකර්ම විද්‍යාල ගණනාවක් වර්තමානයේ ශ්‍රී ලංකාව සතු ය.

## බාධක (Threats)

ශ්‍රී ලංකාව සතු සුවිශේෂී ජෛව විවිධත්වය, මිනිස් ක්‍රියාකාරකම් හා කාලගුණික විපර්යාසයන් හේතුවෙන් පරිහානියට ලක් වීමේ තර්ජනයක් පවතී. වර්තමානය වනවිට ඇතැම් සුවිශේෂී ශාක හා සත්ත්ව විශේෂ වඳවී යෑමේ තර්ජනයට ලක් ව තිබේ. එමෙන් ම, ශ්‍රී ලංකාව සරු පසකින් යුක්ත රටක් වුව ද මේ වන විට ලොව රටවල් අතරින් පාංශු බාදනය (Soil degratation) අතින් දැඩි අවදානම් තත්ත්වයක් තුළ පවතින රටකි. පාංශු සාරවත්භාවයෙන් තොර හෝ කෘෂිකර්මයක් පිළිබඳව සිතිය නො හැකි ය. එමෙන් ම, බෙහෙවින් තිරසාර වූ ආහාර පරිභෝජන රටාවන්ට අතීතයේ සිට උරුමකම් කී ශ්‍රී ලංකාව වර්තමානයේ ව්‍යාකූල සහ අහිතකර පරිභෝජන රටාවන්ට නැඹුරුවෙමින් පවතී. රොබට් නොක්ස් මහතාගේ "එදා හෙළදිව" ග්‍රන්ථයෙන්, අතීතයේ පෝෂණීය සංකල්පවලින් පරිපූර්ණ වූ පරිසර හිතකාමී වූ ආහාර පරිභෝජන රටාවන් පිළිබඳව මැනවින් පිළිබිඹු කරයි. ශරීර බර දර්ශකය- වගු අංක අගයන් අනුව අඩු බර (Under weight) සහ වැඩි බර (Over weight) ඉහල ප්‍රතිශතයක් ගනී. එමෙන් ම, ස්ථූලතාවය වර්ධනය වෙමින් පවතින අතර ඒ ආශ්‍රිතව විවිධ රෝග ගණනාවක් සීඝ්‍රයෙන් පැතිරෙමින් පවතී. මෙම තත්ත්වය කුඩා දරුවන්ට පවා ඇතිවීමේ තර්ජනයක් පවතී.

පවතින තත්ත්වය හමුවේ ගෝලීය වශයෙන් පවතින ආහාර පිළිබඳ අර්බුදකාරී තත්ත්වය නිමාවීමක් දක්නට නො ලැබේ. එය වරින් වර විවිධ ස්වරූප වලින් ලෝකයේ විවිධ කලාප තුළ ඉස්මතු වෙමින් පවති. ඉහළ මට්ටමින් වෙනස් වන ආහාර මිල ගණන් තවදුරටත් ඉදිරියේ දී පවතිනු ඇත. එමෙන් ම, ආහාර අර්බුදයට තුඩු දුන් ප්‍රධාන කාරණා වලට ලෝකය තුළ විසඳුම් තවම නොමැති ය. ගෝලීය කාලගුණික විපර්යාසයන් දිනෙන් දින උග්‍ර වන අතර මේ කෘෂිකාර්මික නිෂ්පාදනයට පවතින ප්‍රබලතම තර්ජනය වේ. ප්‍රධාන රටවල් වල ජෛව ඉන්ධන නිපදවීම දිනෙන් දින වර්ධනය වේ. බොහොමයක් රටවල ආහාර සඳහා ඉල්ලුම සීඝ්‍රයෙන් වර්ධනය වන අතර ඊට සරිලන වේගයකින් නිෂ්පාදනය වර්ධනය නොවේ. මෙම තත්ත්වයන් ලෝකය තුළ වඩාත්ම බලපානු ලබන්නේ අප්‍රිකානු රටවලට සහ දකුණු ආසියාවට වේ. දකුණු ආසියාවේ රටක් වශයෙන් ආහාර සුරක්ෂිතභාවය අප තහවුරු කර ගත යුතු ය. 2008 වසරේ ලෝක බැංකු වාර්ෂික වාර්තාවේ තේමාව වූයේ "සංවර්ධනය සඳහා කෘෂිකර්මය" (Agriculture for Development) යන්න ය. සියළුම ජාත්‍යන්තර ආයතනයන් සහ පර්යේෂකයින් පෙන්වා දෙන්නේ ඉදිරි කාලයේ දී කෘෂිකර්මයේ පවතින වැදගත්කමයි. විශේෂයෙන්, සංවර්ධනය වෙමින් පවතින රටවල් සියළු සංවර්ධන වැඩසටහන් වල දී කෘෂිකර්මය කේන්ද්‍ර කොට සැලසුම් කිරීම අත්‍යවශ්‍ය බව පෙන්වා දී ඇති කරුණකි. එබැවින්, අර්බුදයට මුහුණදීම සඳහා තිරසාර සංවර්ධන වැඩසටහන් අවශ්‍ය ය. මේ සඳහා කෘෂි, ආහාර, සමාජ, ආර්ථික විද්‍යාඥයන්, ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, පාරම්පරික දැනුම සහිත ගොවි ප්‍රජාව හා පෞද්ගලික අංශය යන සියළු පාර්ශවයන්ගේ ඒකාබද්ධ ප්‍රවේශයක් අවශ්‍ය ය. මේ තුළින් කුමන අර්බුද පැමිණිය ද එයට සාර්ථකව මුහුණදීමට අවශ්‍ය ශක්තිය ළඟා කර ගත හැකි වනු නො අනුමාන ය.


**ඩබ්.ඒ. නාලක විජේසූරිය**

*පර්යේෂණ නිලධාරී*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය